**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL- OLD SYLLABUS) – DECEMBER 2021
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි නිර්දේශය) - 2021 දෙසැම්බර්

BUDDHIST PHILOSOPHY – I / බෞද්ධ දර්ශනය- I - (BPG - 1)
Ethics and Psychology/ආචාර විද්‍යාව සහ මනෝ විද්‍යාව

උපදෙස්
එක් කොටසකින් **ප්‍රශ්න දෙකක්වත්** ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. /
Answer **FIVE** questions only selecting at least **two questions** from each section.
සැම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ. / All questions carry equal marks.
මෙම ප්‍රශ්න පත්‍රයට වෙන්වන මුළු ලකුණු ප්‍රමාණය 100% කි. / Total marks allocated for this paper is 100%.
මෙම පත්‍රයෙහි ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. / This paper contains 10 questions.
නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කැපෙනු ලැබේ. / Candidate will be penalized for illegible handwriting.

## PART – I

1. Discuss the role of *Sīla* in the Buddhist path of ethical development of the individual.

   බුදුසමහෙහි එන පුද්ගලයාගේ සදාචාරාත්මක සංවර්ධන මාවතේ දී ශීලයෙහි භූමිකාව සාකච්ඡා කරන්න.

2. Explain the significance of Right View in the ethical life showing how it leads to the transformation of the bodily, verbal and mental conduct of a person.

   සදාචාරාත්මක ජීවිතයේ දී සම්‍යග්දෘෂ්ටියෙහි වැදගත්කම එය පුද්ගලයෙකුගේ කායික, වාචසික සහ මානසික චර්යාවෙහි විපරිණාමය සඳහා මූලික වන සැටි පෙන්වාදෙමින් පැහැදිලි කරන්න,

3. What criteria are proposed in the teachings of Buddhism to determine the difference between ethically good and bad behavior?

   සදාචාරාත්මක වශයෙන් යහපත් සහ අයහපත් චර්යාව අතර වන වෙනස නිර්ණය කරගැනීම සඳහා බුදුමයෙහි නිර්දිෂ්ට මිණුම්දඬු කරරේද?

4. Make your observations on the Buddhist teachings concerning the relationship between the ethical life and human happiness.

   සදාචාරාත්මක ජීවිතය සහ මානව සැපත පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සම්බන්ධව ඔබගේ නිරීක්ෂණ ඉදිරිපත් කරන්න.

අනෙක් පිටුවට... / PTO ...

5. In what manner is the Buddhist goal of Nibbāna related to the ethical life?

බෞද්ධ නිර්වාණ පරමාර්ථය සදාචාරාත්මක දිවිපැවැත්ම සමග සම්බන්ධ වන්නේ කවර අයුරින්ද?

## PART – II

6. What are the methods of knowing used in Buddhism in order to investigate into psychological facts related to human existence?

මානව පැවැත්ම හා සම්බන්ධ මනෝ විද්‍යාත්මක කරුණු ගවේශනය සඳහා බුදු සමයෙහි යොදාගන්නා ඥාන මාර්ග කවරේද?

7. "The primary objective of psychological analysis in Buddhism is to explain under what conditions suffering arises, and how it is possible to become free of suffering." Discuss.

"බුදු සමයෙහි මනෝ විද්‍යාත්මක විශ්ලේෂණයන්හි ප්‍රාථමික අරමුණ කවර ප්‍රත්‍යයන් මුල් කොටගෙන දුක හටගන්නේද සහ දුකින් මිදිය හැකි වන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීමයි." සාකච්ඡා කරන්න.

8. Show how the Buddhist analysis of the person negates the doctrine of the existence of an underlying Soul entity that ensures the identity of a person.

පුද්ගලයෙකුගේ අනන්‍යතාව තහවුරු කරන අභ්‍යන්තර ආත්ම සත්භාවයක් පිළිබඳ වාදය පුද්ගලයා පිළිබඳව කෙරෙන බෞද්ධ විශ්ලේෂණයෙන් නිශේධනය වන සැටි පෙන්වා දෙන්න.

9. Explain the psychological aspects of the meditative experiences described in Buddhism.

බුදු සමයෙහි විස්තර කෙරෙන භාවනාමය අනුභූතීන්හි වන මනෝ විද්‍යාත්මක අංශ පැහැදිලි කරන්න.

10. Discuss the Buddhist view on the nature of the relationship between a person's material body and the mind.

පුද්ගලයෙකුගේ භෞතික ශරීරය සහ මනස අතර ඇති සම්බන්ධතාවේ ස්වභාවය පිළිබඳ බෞද්ධ මතය සාකච්ඡා කරන්න.

=========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL- OLD SYLLABUS) – DECEMBER 2019
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි නිර්දේශය) - 2020 දෙසැම්බර්

BUDDHIST PHILOSOPHY - II / බෞද්ධ දර්ශනය II - (BPG - 2)
(බෞද්ධ දර්ශන ඉතිහාසය, තුලනය හා භාවිතය)

**උපදෙස්/ Instructions:**

ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. / Answer **FIVE** questions only.

මෙම පත්‍රයෙහි ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. / This paper contains 10 questions.

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ. / All questions carry equal marks.

මෙම ප්‍රශ්න පත්‍රයට වෙන්වන මුළු ලකුණු ප්‍රමාණය 100% කි. / Total marks allocated for this paper is 100%.

---

"බුදු දහමේ උදාව සමකාලීන භාරතීය දාර්ශනික චින්තනය නව මගකට යොමු කළේය." සාකච්ඡා කරන්න.
"The rise of Buddhism, gave a new direction to contemporary Indian philosophical thought." Discuss.

1. ආත්මවාදය කෙරෙහි බුදුන් වහන්සේගේ ප්‍රතිචාරය විචාරපූර්වකව විමසන්න.
   Critically examine the Buddha's response to the doctrine of soul (*attavāda*).

2. "මුල් බුදුදහමේ ඥානය ලබාගැනීමේ පදනම අනුභූතිවාදී වෙයි." සාකච්ඡා කරන්න.
   "The basis for obtaining knowledge in Early Buddhism is empiricist." Discuss.

3. නිර්මාණවාදය නොපිළිගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ විමසීමක් කරන්න.
   Examine the Buddhist teachings presented in favor of the non-acceptance of the creation theory.

4. අභිධර්මයේ සංවර්ධනය උදෙසා සර්වාස්තිවාද සම්ප්‍රදායයේ දායකත්වය පරීක්ෂා කරන්න.
   Examine the contribution of the Sarvāstivāda tradition for the development of the Abhidhamma.

අනෙක් පිටුවට... / **PTO ...**

5. අභිධර්මයේ සංවර්ධනය උදෙසා සර්වාස්තිවාද සම්ප්‍රදායයේ දායකත්වය පරීක්ෂා කරන්න.
Examine the contribution of the Sarvāstivāda tradition for the development of the Abhidhamma.

6. යෝගාචාර (විඥානවාදී) දර්ශනය ථෙරවාද බුදු දහමේ මූලික ඉගැන්වීම්වලට කෙතෙක් දුරට අනුකූල වන්නේදැයි විමසන්න.
Examine how far the Yogācāra (*Vijñānavādi*) philosophy is compatible with the fundamental teachings of Theravāda Buddhism.

7. සෞත්‍රාන්තික දර්ශන සම්ප්‍රදායයේ ක්ෂණවාදය පිළිබඳ ඉගැන්වීම පැහැදිලි කරන්න.
Explain the teaching concerning the theory of momentariness of the Sautrāntika philosophical tradition.

8. මහායාන ඉගැන්වීම් තුළ පෙන්වා දෙන බුදුන් වහන්සේගේ ත්‍රිකාය සිද්ධාන්තය විමසීමට ලක්කරන්න.
Make an inquiry into the doctrine of three bodies (*trikāya*) of the Buddha as shown in the Mahāyāna teachings.

9. ප්‍රතීත්‍යසමුත්පාදය ශූන්‍යතාව වශයෙන් ආචාර්ය නාගාර්ජුන පාදයන් විසින් කෙරෙන පැහැදිලි කිරීම මාධ්‍යමික සම්ප්‍රදය ඇසුරෙන් පහද දෙන්න.
Elucidate with reference to the Mādhyamika tradition, Ācārya Nāgārjuna's explanation of *pratītyasamutpāda* (causality) as *śūnyatā* (voidness).

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>හතරකට</u> කෙටි සටහන් ලියන්න.
Write short notes on any **<u>four</u>** of the following topics:

i. ආලය-විඥනය / Concept of Store-consciousness
ii. බෝධිචිත්ත සංකල්පය / Bodhicitta (Concept of Bodhi - mind)
iii. පරියත්ති-සාසන / Pariyatti-sāsana (Textual learning)
iv. භවංග සංකල්පය / Concept of Bhavaṅga
v. මහාවිභාෂා / Mahāvibhāśā
vi. පරමාර්ථසත්‍යය / Ultimate truth

=========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – . . 2021

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2021

BUDDHIST PHILOSOPHY - III / බෞද්ධ දර්ශනය- III - BPG - 3
(පාරභෞතික විද්‍යාව හා ඥානමීමාංසාව)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි.)

---

1. පුරාතන ඉන්දියාවේ ආගමික සම්ප්‍රදායයන් මගින් යථාර්ථයේ ස්වභාවය පිළිබඳ නිගමනයන්ට පැමිණීමේදී යොදාගන්නා ලද ඥානවිභාගවාදී ප්‍රමාණ පිරික්සන්න.

2. යථාර්ථය පිළිබඳ ප්‍රමාණවත් ඥානයක් තර්කය මගින් පමණක් ලද හැකිය යන මතය බුදුසමයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබෙන්නේ කුමන දාර්ශනික පදනමක් මතද යන්න පැහැදිලි කරන්න.

3. බුදුසමය ඥාන විභාගයේදී ඉන්ද්‍රිය ඥානය සියලු ඥානයේ මූලික පදනම වශයෙන් යොදාගෙන ඇති අයුරු සූත්‍ර දේශනා ආශ්‍රයෙන් පිරික්සන්න.

4. බෞද්ධ ඉගැන්වීම් තුළ ස්වච්ඡන්දතාවට හිමිවන ස්ථානය පැහැදිලි කරන්න.

5. භාරතීය දර්ශනයේ සාකච්ඡාවට භාජනයව ඇති ආත්ම සංකල්පය පිළිබඳ විස්තරයක් සපයන්න.

6. බුදුන් වහන්සේ අනාත්ම ඉගැන්වීම පැහැදිලි කිරීමේදී සංස්ලේෂණ හා විශ්ලේෂණ ක්‍රම යොදාගත් අයුරු පැහැදිලි කරන්න.

7. බෞද්ධ කර්ම දර්ශනය පාරභෞතික විද්‍යාවක් වශයෙන් හඳුන්වාදීමේ යුක්ති යුක්ත බව සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට...

8. දුක්ඛ සම්භවය පිළිබඳ හේතුඵල පදනම පිරික්සන්න.

9. නිර්වාණය පරම සැපතක් වශයෙන් නිර්ණය කළ හැක්කේ කුමන හේතු සාධක අනුවද යන්න පැහැදිලි කරන්න.

10. බුදුරජාණන් වහන්සේ අව්‍යාකත ප්‍රශ්න ලෙස සලකා බැහැර කළ ප්‍රශ්න 10 හඳුන්වා දී ඒවා එසේ බැහැර කළේ මක්නිසාදැයි පෙන්වා දෙන්න.

============